# සිංහල භාෂාව හා සාහිත්‍යය

## 10 ශ්‍රේණිය



Start Your Learning Journey with e-thaksalawa
The National e-learning Portal for The General Education

විෂය - සිංහල භාෂාව හා සාහිත්‍යය

ශ්‍රේණිය - 10

වාරය - 01

ඒකකය - 07 බසින් රස මවන සාහිත්‍යය

ඉගෙනුම් පල -:

- අද්‍යතන සාහිත්‍ය නිර්මාණ කියවා ඒවායේ අන්තර්ගතය පිළිබඳ අදහස් ප්‍රකාශ කරයි.
- සාහිත්‍ය නිර්මාණවල දී විවිධත්වයෙන් යුතු ව භාෂාව භාවිත කිරීම අගය කරයි.
- සාහිත්‍ය නිර්මාණයක අන්තර්ගතයෙන් නිරූපණය වන කරුණු විචාරාත්මක ව ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම i**

1. පහත ප්‍රකාශයන්ගෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

i. සාහිත්‍යය යනු ජනකවි හා ජනකතා ය.
ii. ආගමික දාර්ශනික හා විද්‍යාත්මක ලේඛන සාහිත්‍යය යි.
iii. භාෂාව මාර්ගයෙන් අසන්නාගේ හෝ කියවන්නාගේ සිතෙහි රසයක් හා චමත්කාරයක් ඇති කරන නිර්මාණ සාහිත්‍යය යි.
iv. ලිඛිත අලිඛිත සියලු දෑ සාහිත්‍යය යි.

2. හිස් තැනට වඩාත් සුදුසු පදය තෝරන්න.

(අ) භාෂාවේ විවිධ ස්වරූප ------------- කර ගනිමින් කාව්‍යෝක්ති නිර්මාණය කර ගැනීමට කවියෝ සමත් වෙති.

i. මිශ්‍ර ii. එකතු iii. උද්ධෘත vi. සුසංයෝජනය

(ආ) කවියා බස හසුරුවන්නේ ----------------- දැනවීමට ය.

i. වාච්‍යාර්ථ ii. ලක්ෂ්‍යාර්ථ iii. ව්‍යංග්‍යාර්ථ iv. ගෞරවාර්ථ

4. දී ඇති යෙදුම් ආශ්‍රයෙන් පහත වගුව නිවැරදි ව සම්පූර්ණ කරන්න. (භාව හීනය, ව්‍යංග්‍යාර්ථය, භාවපූර්ණය, නිශ්චිතාර්ථය)

| කවියාගේ වාක්කෝෂය | විද්‍යා ලේඛකයාගේ වාක්කෝෂය |
|---|---|
| | |
| | |

අන්තර්ගතය -එච්.එම්.ජේ.එස්.කුමාරසිංහ, ආනන්ද විද්‍යාලය, කොළඹ 10

සැකසුම -කේ.ජී.එම්.අයි.තුෂාර, බ/අලුයටවෙල මහ විද්‍යාලය, මහියංගණය

Copyright©www.e-thaksalawa.moe.gov.lk

5. භාෂාවේ භාවික ගුණය යනු

i. යහපත් මානසික ගුණ ධර්ම ප්‍රකාශ කිරීමේ හැකියාව යි.
ii. කවියාගේ අත්දැකීම ප්‍රකාශ කිරීමට භාෂාව භාවිත කිරීමේ ඇති හැකියාව යි.
iii. රසිකයාගේ භාවයන් ප්‍රබෝධ කොට ඔහු මැනවින් අත්දැකීමට සහභාගි කරවා ගැනීමේ හැකියාව යි.
iv. භාෂාවේ වචනවල පවත්නා හැඟීම් දැනවීමේ ගුණය මනාව යොදා ගැනීමේ හැකියාව යි.

**ක්‍රියාකාරකම ii**

1. ''යකඩ කඳන් උස්සාලා
මේ නගරය ගොඩ නැඟුවේ
නුඹේ තාත්තා නිසා ය''

මෙහි සඳහන් තාත්තා

i. ගොවියෙකි
ii. කම්කරුවෙකි
iii. ඉංජිනේරුවෙකි
iv. ව්‍යාපාරිකයෙකි

2. ''මතු දවසේ
ඒ පොළොවේ සූරිය මල
නුඹ නිසා ය''

මෙහි යෙදී ඇති කාව්‍යාලංකාරය

i. අනුප්‍රාසය යි.
ii. උපමාලංකාරය යි.
iii. රූපකාලංකාරය යි.
iv. උත්ප්‍රේක්ෂාලංකාරය යි.

3. ''සඳ කැලුම් නිසා සීතාවක සඳ ලොවින් ගෙනා සඳ කඩක් මෙන් රිදී පැහැයෙන් බබළන්නට විය.''

මෙහි අන්තර්ගත උපමාව හා උපමේය වෙන් කොට ලියන්න.

අන්තර්ගතය -එච්.එම්.ජේ.එස්.කුමාරසිංහ, ආනන්ද විද්‍යාලය, කොළඹ 10
සැකසුම -කේ.ජී.එම්.අයි.තුෂාර, බ/අලුයටවෙල මහ විද්‍යාලය, මහියංගණය
Copyright©www.e-thaksalawa.moe.gov.lk

4. ''පාළුවට ගිය හේනක් නම් තමයි දැන් එය
ඒත් තාමත් හේන ගාවින් යන අය
ඇහෙන බැව් කියනවා
බතල අල වගයක් හුස්මගන්නා හඬ
හෙමිහිට''

මෙහි ඇතුළත් කාව්‍යෝක්තියක් උපුටා දක්වන්න.

5. මැනවින් පුරුදු පුහුණු බව යන්නට තනි පදයක් පාඩමෙන් උපුටා ලියන්න.

6. '' අර ඉන්නේ එයා නේද? අර දියට මොනවදෝ වීසි කරනවා.''

මේ පාඨය ඇතුළත් ග්‍රන්ථය හා කතුවරයා නම් කරන්න.

7. ''සුනේත්‍රාගේ හඬින් සේනාධීරගේ සිතෙහි ඇති වූයේ <u>ප්‍රහර්ෂයකි''</u>

ඉරි ඇඳි පදයේ අර්ථය නිවැරදි ව කියැවෙන වරණය තෝරන්න.

i. අධික සතුටකි
ii. මහත් පුදුමයකි
iii. විශාල හිනාවකි
iv. තැති ගැනීමකි

8. **විස්මයෝත්ඵුල්ල , උක්තීන් ,පරිපෝෂිත, ධ්වනිපූර්ණ** යන පදවල අර්ථ නිවැරදි ව කියැවෙන වරණය තෝරන්න.

i. මනාව විකසිත වූ, කියමන්, මනාව වට වූ, සැඟවුණු අර්ථයකින් පෝෂිත
ii. පුදුමයෙන් පිරී ගිය, උක්තය, මනාව පෝෂණය වූ, ශබ්දයකින් පිරුණු
iii. පුදුමයෙන් පිරී ගිය, කියමන්, මනාව පෝෂණය වූ, සැඟවුණු අර්ථයෙන් පිරුණු
iv. පුදුමයෙන් ඇරුණු, යෙදුම්, මනාව වර්ධනය වූ, සැඟවුණු අර්ථයෙන් පිරුණු

9. කවියකු ලෙස ප්‍රකට නො වූවකු ද ඇතුළත් වරණය තෝරන්න.

i. ගුණදාස අමරසේකර, බර්ටි කුඩාහෙට්ටි, දයාසේන ගුණසිංහ, මීමන ප්‍රේමතිලක
ii. ජී. බී. සේනානායක, ධර්මසිරි රාජපක්ෂ, රත්න ශ්‍රී විජේසිංහ, නන්දන වීරසිංහ
iii. මොනිකා රුවන්පතිරණ, සිරිගුනසිංහ, පරාක්‍රම කොඩිතුවක්කු, රුවන් බන්දුජීව
iv. ආරියවංශ රණවීර, මහගම සේකර, කේ. ජයතිලක, එච්. එම්. කුඩලිගම

අන්තර්ගතය -එච්.එම්.ජේ.එස්.කුමාරසිංහ, ආනන්ද විද්‍යාලය, කොළඹ 10
සැකසුම -කේ.ජී.එම්.අයි.තුෂාර, බ/අලුයටවෙල මහ විද්‍යාලය, මහියංගණය
Copyright©www.e-thaksalawa.moe.gov.lk

10. පරිකල්පනය යනු

i. භාත්පසින් කල්පනා කර බැලීමයි.
ii. සාහිත්‍ය කලා නිර්මාණ සඳහා අවශ්‍ය දෑ සිතින් මවා ගැනීම ය.
iii. ගැඹුරින් කල්පනා කොට නිර්මාණකරණයේ යෙදීමයි.
iv. අසා දැක කියවා විඳ ඇති දේ ඔස්සේ සිත මෙහෙය වීමයි.

11. නිවැරදි ව ගළපන්න.

| | |
|---|---|
| පරාක්‍රම කොඩිතුවක්කු | නිර්මාණය හා විචාරය |
| මහගග සේකර | සදා මෙලෙස පුර දෙරණේ |
| විමල් දිසානායක | සුනේත්‍රා |
| ඩබ්. ඒ. සිල්වා | සක්වා ලිහිණි |
| ඒ.වී. සුරවීර | අකීකරු පුත්‍රයකුගේ ලෝකය |

අන්තර්ගතය -එච්.එම්.ජේ.එස්.කුමාරසිංහ, ආනන්ද විද්‍යාලය, කොළඹ 10
සැකසුම -කේ.ජී.එම්.අයි.තුෂාර, බ/අලුයටවෙල මහ විද්‍යාලය, මහියංගණය
Copyright©www.e-thaksalawa.moe.gov.lk